# බෞද්ධ ස්තූපයේ විකාශය හා ඉන් ප්‍රකට වන ධර්ම සන්නිවේදනය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

පී.ඩී සුගාරි කාංචනා, ඊ.යූ.පී චන්දිමා පතිරණ*

බුදුරජාණන් වහන්සේගේ ශාරීරික ධාතු තැන්පත් කොට ඉදි කරන ලද ස්තූපය "ශාරීරික චෛත්‍ය" යන අන්වර්ථ නාමයෙන් ද හඳුන්වනු ලබයි. සර්වඥ ධාතු තැන්පත් කොට ස්තූප නිර්මාණය ආරම්භ වන්නේ බුද්ධ පරිනිර්වාණයෙන් පසුව ය. බුදුරජාණන් වහන්සේ ජීවමානව වැඩ වෙසෙන අවධියේදී ම පිරිනිවන් පෑ සැරියුත් මුගලන් අගසව් දෙනමගේ භෂ්මාවශේෂ තැන්පත් කොට ස්තූප නිර්මාණය කර ඇත්තේ උන්වහන්සේගේ ම උපදෙස් අනුවම ය. වර්තමානයේ දී ස්තූපය බෞද්ධ පුද පූජා විධි පිළිබඳ කේන්ද්‍රස්ථානයක් වශයෙන් සුප්‍රසිද්ධ වුවද එය බෞද්ධ නිර්මාණයක් නොවේ. ප්‍රාග් බෞද්ධ යුගයේ සිට ඉන්දියාවේ ප්‍රචලිතව පැවති එය එක්තරා සුසානයක් ලෙස ව්‍යාප්තියට පත්ව තිබිණි. ස්තූපය බෞද්ධ පූජනීය සංකේතයක් බවට පත්වීමට ප්‍රධානත ම හේතුව වන්නේ බුද්ධ භාෂිතයයි. මහා පරිනිබ්බාණ සූත්‍රය ඇසුරෙන් එය මනාව ප්‍රකට වේ.

බෞද්ධ ස්තූපය නිර්මාණයේ විකාශයත් සමග එහි ආකෘතිය පිළිබඳ වර්ධනයක් දක්නට ලැබේ. ස්තූපයේ ගර්භය විවිධ හැඩයෙන් නිර්මාණය වන්නට පටන් ගනුයේ එහි ප්‍රතිඵලයක් වශයෙනි. සාංචි ස්තූපය පූර්වාදර්ශය කොට ගත් ස්තූප නිර්මාණ සංකල්පය ලක්දිවට ලැබෙනුයේ භාරතයෙනි. ස්තූප නිර්මාණය ශ්‍රී ලංකාවේ සීඝ්‍රයෙන් ප්‍රචලිත වීමත් කෙටි කාලයක් තුල ස්තූපයට විවිධාංගයන් එකතු වීමත් බෙහෙවින් දක්නට ලැබෙන්නකි. බෞද්ධ ස්තූපයේ සංවර්ධනය යුග කිහිපයකදී සිදු වූවකි. එලෙස සංවර්ධනය වූයේ බෞද්ධ දර්ශනයට කිසියම් ගැඹුරු යථාර්ථයක් විෂද කිරීමට ගත් උත්සාහයේ ප්‍රතිඵලයක් වශයෙනි. ස්තූප, විග්ගුරත්, ෂාරුත, ඒඩුක, චෛඩුක, ඒලුක, සමවසරණ, පැගෝඩා ආදී විවිධ නම් වලින් හැඳින්වෙන ස්මාරක විශේෂය මියගිය තැනැත්තෙකුගේ භෂමාවශේෂ සහිතව හෝ රහිතවද මියගිය අයෙකුට ගෞරව පිණිසද ප්‍රාග් බෞද්ධ යුගයේ ලොව රටවල් කිහිපයක ප්‍රචලිතව පැවති ඉදිකිරීමක් ලෙස හඳුන්වා දිය හැක. ප්‍රාග් බෞද්ධ යුගයේදී මෙරටේ බෞද්ධ ස්තූප ඉදි වූ බවට තොරතුරු වංශ කතාවල දක්නට ලැබෙතත් ඒවා පුරා විද්‍යාත්මකව තහවුරු කරන්නට සාක්ෂි හමු නොවේ. ස්තූපය වඩා සංකීර්ණ වූ ගැඹුරු වූ සංකේත ප්‍රකාශනයකි. මේ පිළිබඳව විමර්ශනය කිරීමට ප්‍රථම ලංකාවේදී ස්තූප නිර්මාණයෙහි සිදු වූ විකාශනයන් සහ වර්ධනීය ලක්‍ෂන පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමද අත්‍යවශ්‍ය වේ. බෞද්ධ ස්තූපයෙන් හෙළිවන ධර්ම සන්නිවේදනයට පදනම් වන්නේ ස්තූප සම්ප්‍රදායේ ප්‍රාථමික අවධිය නොව සංවර්ධනීය අවධියයි. එකී සංවර්ධනය සිදු වූයේ ලාංකීය නිර්මාණ ශිල්පීන් අතිනි. මෙම පර්යේෂණයෙහි අරමුණ වන්නේ බෞද්ධ ස්තූපයේ විකාශය හා ඉන් ප්‍රකට වන ධර්ම සන්නිවේදනය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් සිදු කිරීමට බලාපොරොත්තු වීමයි.

ප්‍රමුඛ පද - අවබෝධය, ආධ්‍යාත්මික වින්දනය, උරුමය, කලා ශිල්ප, සන්නිවේදනය

* පාලි හා බෞද්ධ අධ්‍යනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය gdskanchana66@gmail.com / pathiranachaandi@gmail.com